# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,909 — 1970 ජූනි 5 වැනි සිකුරාද — 1970.6.5

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 735 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | 749 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 740 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


## තනතුරු – ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන්කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් සවකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන වන මුදලක් ඒ අර මුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන්ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥා පනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම පිළිබඳ

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. ඩී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 38 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියලුම නීතිරීති හා ව්‍යවස්ථාවලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

(iii) (අ) ඔවුන් ස්වකීය රාජකාරි කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අත්‍යවශ්‍ය නොවන්නාවූ අති විශේෂ අවස්ථාවන් හිදී හැර ඔවුන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය තුළදී රාජ්‍ය භාෂාව වන සිංහලය පිළිබඳ ක්‍රියාත්මක දැනුමක් ලබාගත යුතුය.

(ආ) ආධුනික/පරීක්ෂා සේවා කාලය අවසානයේදී ඔවුන්ගේ පත්වීම් ස්ථිර කිරීම, වෙනත් කරුණු අතර කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ තත්ත්වයට වඩා උසස් නොවන තත්ත්වයක් දක්වා යොමුවන නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණ, නියමිත කාල පරිච්ඡේදයක් තුළදී සමත්වීම උඩ රඳා පවතිනු ඇත. නියමිත කාල පරිච්ඡේදයන් ඇතුළත මේ ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් වීමට අපොහොසත් වුවහොත් ඒවා සමත්වන තෙක්, ලැබිය යුතු වැටුප් වැඩිවීම් නොගෙවා හැරීම එහි ප්‍රතිඵලය වන්නේය. ස්වකීය ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවසාන වන විට අවශ්‍ය සිංහල ප්‍රවීණතා තත්ත්වය ලබා නොගත්තා නිලධාරීන්ගේ සේවය නතර කරනු ලැබීමට ඉඩ ඇත්තේය.

**සංලක්ෂ්‍යය.**—රාජ්‍ය සේවයට බැඳීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබන අය, පත්වීම් ස්ථිර කිරීමේ පූර්ව නියමයක් වශයෙන් මේ සිංහල ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්වීමෙන් නිදහස් කරනු ලබති.

5. **අවශ්‍ය සුදුසුකම්.**—(i) තමා ලාංකිකයෙකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවෙකු විසින්ම ඉදිරිපත් කළ යුතුය. ලාංකික යනුවෙන් සඳහන් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටීම අවම අධ්‍යාපනික සුදුසුකම ලෙස නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන්නකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලත් සිංහලයකු වෙතොත් ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් සිංහල භාෂාව විෂයයෙන් හෝ ඊට සමාන විෂයයකින් හෝ සාමාර්ථය ලබා තිබිය යුතුය. (වර්ෂ 1961 ජනවාරි 1 වෙනිදාට පෙර සිට රාජ්‍ය සේවයේ යෙදී සිටියාවූ ද රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු ලබනු කැමැත්තාවූ ද නිලධාරීන් සම්බන්ධයෙන් මෙම නියමය අදාළ නො වන්නේ ය.)

6. **යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙකම සුදුසුකම් ලැබ සිටින්නාවූ, මහා රාජිණියන් වහන්සේගේ යුද්ධ හමුදාවන් හි යෙදී සිටි සේවාමුක්ත වූද අයට සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන් හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස්වූවන් හැර) සෑම කෙනෙකුටමද ඔව්හු 1945 අගෝස්තු මස 15 වෙනි දිනට පෙර එකී හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩවා සේවය කළෝ නම් වයස පිළිබඳ සුදුසුකම් ලබාගැනීම සඳහා පමණක් ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනත් යන මේ දැතුර තමන් සේවයෙහි යෙදී සිටි කාල පරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩදෙනු ලැබේ.

7. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. එසේකුදු වුවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන විසින් ප්‍රසිද්ධ කරන ලද තනතුරක් පිළිබඳව ඉල්ලුම් කරන සෑම රජයේ සේවයේ නිලධාරියෙකු විසින් ම, තම ඉල්ලුම් පත්‍රය එසේ එව්වේ කවදාදැයි, ඒ සඳහා සපයා ඇති "ආ" සලකුණ දරණ මුද්‍රිත තැපැල් පතේ ලියා, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට කලින් හෝ ලැබෙන ලෙස, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන වෙත කෙළින්ම එවිය යුතුය. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු එම ඉල්ලුම්කරුවන් (තෝරාගනු ලැබුව හොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූලව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම්ව සිටින්දැ නැද්දැයි සඳහන් කොට එවිය යුතුය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක දන්වනු ලබන තැනට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමෙකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැණීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපෑවැත්මකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සෙකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණිනම් රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නිගමනයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. **සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යන්නෙහි විග්‍රහය.**—සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යනුවෙන් අදහස් කරනුයේ මූලික ස්ථිර තනතුරේ වැටුප් පමණි. වැඩ බැලීම සඳහා ගෙවන වැටුප් දීමනා ආදිය කිසිවක් ඊට ඇතුළත් නොවේ.

---

අංකය : ඒඒ 46/එක්ස් 2245/70

## ලංකාණ්ඩුවේ දුම්රිය සේවය

### යාන්ත්‍රික ඉංජිනේරු තනතුරු

ලංකාණ්ඩුවේ දුම්රිය සේවයේ යාන්ත්‍රික ඉංජිනේරු තනතුරු සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනා කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන් හි වූ ඉල්ලුම්පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1970 ජූනි මස 20 වැනිදා.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1970 ජූනි මස 27 වැනිදා.

සටහන් :

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක්ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්දාවූද මුද්දර නොගැසුවා වූ ද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝරම විදේශියෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාල වලින් ලබාගත හැකිය. තම ඉල්ලුම්පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළතදී භාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන් ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස පිළිගත් වෛද්‍යවරයකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුවෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති සහ කොන්දේසි.**—(i) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. පත් කරනු ලබන්නන් අවුරුදු තුනක කාලයක් පුහුණුව ලැබිය යුතු අතර, එම කාලය තුළ ඔවුන් ආධුනික තත්ත්වයෙහි තබනු ලැබේ. ඔවුන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

තෝරාගත් අයදුම්කරුවෝ, පත්වීම ලැබීමට පෙර, සම්මත අක්ෂි දෘෂ්ටි පරීක්ෂණයකින් ද සමන්විතව ශාරීරික යෝග්‍යතාවය නිගමනය කිරීම සඳහා පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුත්තාහ. ඔවුන් තුන් අවුරුදු පුහුණුව විශ්වාසවන්තවද, අනලස්වද සපුරාලීමේ සහ පුහුණුව සාර්ථක ලෙස අවසන් කිරීමෙන් අනතුරුව යටත් පිරිසෙයින් අවුරුදු 15ක් වත් රජය සඳහා සේවය කිරීමේ ගිවිසුමකට හා බැඳුම්කරයකට ඇතුළත් විය යුතුය. බැඳුම්කරයේ මුදල රු. 40,000 ක් වේ.

(ii) පුහුණුවීමේ පාඨමාලාව පහත දැක්වෙන පරිදි නියම කෙරේ :—

(අ) අවුරුදු 2½—දුම්රිය ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු විසින් පිළියෙල කරනු ලබන පරිදි, රත්මලානේ දුම්රිය කර්මාන්තශාලාවන්හි දී ප්‍රායෝගික පුහුණුවක් ලැබීම ;

(ආ) මාස 6—දුම්රිය ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ විවිධ ධාවනාගාරවල සහ කාර්යාලවලදී යාන්ත්‍රික අංශයේ වැඩ පිළිබඳ ප්‍රායෝගික පළපුරුද්දක් ලැබීම ;

(ඇ) දුම්රිය සේවයේ වැඩ පිළිබඳ පළපුරුද්දක් හා පුළුල් අවබෝධයක් මෙන්ම වගකීම ඉසිලීමේ හැකියාවක් ලබනු පිණිස අතිරේක දීමනාවක් නොමැතිව ඕනෑම තනතුරක වැඩ බැලීම හෝ ඕනෑම රාජකාරියක් ඉටු කිරීම.

(iii) පත් කරනු ලැබූ අපේක්ෂකයින් තුන් අවුරුදු ආධුනික කාලය තුළදී,

(අ) දුම්රිය ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු විසින් නියමිත කර්මාන්තශාලීය පුහුණුව පිළිබඳ න්‍යායික සහ ප්‍රායෝගික පරීක්ෂණය විශිෂ්ඨ ලෙස ද,

(ආ) දුම්රිය ආරක්ෂක නීති හා රෙගුලාසි පරීක්ෂණය විශිෂ්ඨ ලෙස ද,

(ඇ) දුම්රිය දෙපාර්තමේන්තුවට අදාල පමණින්, දුම්රිය දෙපාර්තමේන්තු උපදේශ (පාලන), රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා කාර්ය සංවිධාන සංග්‍රහයේ රෙගුලාසි, මුදල් රෙගුලාසි ආදිය පිළිබඳ පරීක්ෂණය විශිෂ්ඨ ලෙස ද,

සමත් විය යුතුවේ.

(iv) ඔවුහු තුන් අවුරුදු ආධුනික කාලය ඇතුළත නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් විය යුත්තාහ.

(v) පුහුණුව ලබන්නන්ගේ අවශ්‍යතාවයන්ට සරිලන පරිදි කවර අංශයක හෝ පුහුණුව වෙනස් කිරීමට දුම්රිය සාමාන්‍යාධිකාරිට හැකිය. නියමිත කවර කොන්දේසියක් වුව ද ඉටු කිරීමට අපොහොසත් වී නම් හෝ පුහුණු වීමේ කවර අවස්ථාවකදී වුවද ස්වකීය වැඩ සහ හැසිරීම පිළිබඳ සතුටුදායක වාර්තා ලබා ගැනීමට නොහැකි වී නම් හෝ ඔවුන්ගේ පත්වීම් නතර කිරීමට ඉඩ ඇත.

3. **වැටුප් හා දීමනා.**—මෙම තනතුරුවලට හිමි ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේ ය :

වර්ෂයකට රුපියල් 7,800—360×3—8,880/9,600—360×4 හා 480×11 රුපියල් 16,320 (රු. 9,600 හා රු. 13,920 ට පෙර කාර්යක්ෂමතා කඩ ඉම්වේ).

**සටහන :**

(i) ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ රු. 13,440 ක වාර්ෂික වැටුප ඉක්මවීමට ලන්ඩන්හි යාන්ත්‍රික ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය හෝ ලංකා ඉංජිනේරු ආයතනයේ අධිසාමාජිකත්වය හෝ සාමාජිකත්වය ලබාගත යුතු ය.

(ii) ලන්ඩන්හි යාන්ත්‍රික ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය හෝ ලංකා ඉංජිනේරු ආයතනයේ අධිසාමාජිකත්වය හෝ සාමාජිකත්වය හිමි අයදුම්කරුවකු මෙම තනතුරකට පත් කිරීම සඳහා තෝරාගනු ලැබුවහොත්, ඔහු ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ වර්ෂයකට රු. 9,960 ක ආරම්භක වැටුප මත තබනු ලැබේ.

(iii) තෝරාගත් අයදුම්කරුවකු ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ රු. 9,960 ක වැටුප් පියවරට එළඹීමට පෙර ලන්ඩන්හි යාන්ත්‍රික ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය හෝ ලංකා ඉංජිනේරු ආයතනයේ අධි සාමාජිකත්වය හෝ සාමාජිකත්වය ලබා ගතහොත්, ඔහු එම සුදුසුකම් ලබාගත් දින සිට රු. 9,960 ක වැටුපක් ලැබීමට සුදුසු වේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව ;

(බී) 1970 ජුනි මස 20 වැනි දිනට වයස අවුරුදු 21ට නොඅඩුවූද, අවුරුදු 30 ට නොවැඩිවූ ද බව ;

(සී) ලංකා විශ්ව විද්‍යාලයයේ ඉංජිනේරු උපාධියක් (යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පය) හෝ සමාන පිළිගත් උපාධියක් ලබා ඇති බව ; **නැතහොත්**

(ඩී) ලන්ඩන්හි යාන්ත්‍රික ඉංජිනේරු ආයතනයේ උපාධිධාරී සාමාජිකත්වය හෝ සමාන සුදුසුකමක් ඇති බව ; **නැතහොත්**

(ඊ) ලංකා ඉංජිනේරු ආයතනයේ යාන්ත්‍රික ඉංජිනේරුවන් සඳහා උපාධිධාරී සාමාජිකත්වය.

**සටහන :**

(i) යථෝක්ත සුදුසුකම් ලබා ඇති දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවකයින්ගේ වයස අවුරුදු 30ට වැඩි වුවද, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 40 ට නොවැඩිනම් ඔවුන්ට අයදුම් කළ හැකිය.

(ii) 1961 අංක 70 දරණ අනිවාර්ය රාජ්‍ය සේවා පනත යටතේ ඉංජිනේරු තනතුරුවලට පත් කරනු ලැබ සිටින ඉංජිනේරුවන් ද මෙම තනතුරුවලට ඉල්ලුම් කිරීමට සුදුස්සෝ වෙති.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයකුම සූදානම් විය යුතුය.

(ඒ) උප්පැන්න සහතිකය.—(සැ. යු. අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය ;

(සී) චරිත සහතික දෙකක්-මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදා දැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැන ගන්ට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර ෆෝර්මය සමග තමන්ට එවන ලද ("බී" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වෙනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත්‍ර ෆෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("ඒ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම්පත්‍ර ෆෝර්මය මෙම කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නා වූද ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 මැයි මස 29 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය,
තැපැල් පෙ. 500.

6–113—70.6.5 දින අංක 14,909 දරන ගැසට් පත්‍රය

---

## ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණයදෙන ආයතනය

### කාර්යාල කම්කරු තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා ආයතනයේ සේවයේ [illegible] ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ. සෑම ඉල්ලුම්පත්‍රයක්ම 1970 ජූනි 20 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන ලෙස සාමාන්‍යාධිකාරී වෙත එවිය යුතුයි.

සේවය ස්ථිර කළායින් පසුව මෙම තනතුරට රු. 55—8× රු. 2/50; 9× රු. 3; 1× රු. 4—රු. 106 පරිමාණය අනුව මාසික වැටුප් ගෙවනු ලැබේ. මෙම වැටුපට අමතරව ආයතනයේ ක්‍රමය අනුව ජීවනාධාර දීමනාවත් සහ ගෙවල් කුලී දීමනාවද ගෙවනු ලැබේ. නමුත් තනතුර ප්‍රථමයෙන් තාවකාලික සහ අනියම් හෙයින් ස්ථිර කරන තුරු දිනකට රු. 1.33 බැගින් වැටුප් ගෙවනු ලැබේ.

සෑම ඉල්ලුම්කරුවෙක්ම 1970 ජූනි 20 වැනි දිනට වයසින් අවුරුදු 18 කට අඩු නොවිය යුතු අතර අවුරුදු 28 කට වැඩි නොවිය යුතුයි. තවද, ඉල්ලුම්කරු විශිෂ්ඨ චරිතයෙන් සහ යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් සිටිය යුතුයි. උප්පැන්න සහතිකය ඇතුළු 7 වැනි ප්‍රමාණය සමත්වූ බවට අධ්‍යයන සහතිකය ඔහු විසින් ඉදිරිපත් කළ යුතුයි.

හි. සැ. පො. ගුණවර්ධන,
සාමාන්‍යාධිකාරී.

තැ. පෙ. 20, 292, ගාලු පාර,
කොළඹ 3. 1970 මැයි 22 දා.

6–110—70.6.5 දින අංක 14,909 දරන ගැසට් පත්‍රය

---

## ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

### විදුලි ලෝහාලේපක තනතුර

ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ විදුලි ලෝහාලේපක තනතුරක් සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අග දැක්වෙන ආකෘතිය අනුව පිළියෙල කළ ඉල්ලුම්පත් 1970 ජූලි 5 වැනි දිනට හෝ ඊට පෙර හෝ, ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ, ටොරින්ටන් චතුරශ්‍රය, කොළඹ 7, යන ලිපිනයට එවිය යුතුය.

2. **සේවයේ නියුක්ත කිරීමේ විශේෂිත සේවා කොන්දේසි.**—තනතුර ස්ථිරය. පත් කරනු ලබන්නාගේ විශ්‍රාම වැටුප් හිමි තත්ත්වය 1964. 2. 7 වැනි දින අංක 633 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ විධිවිධානයන්ට යටත් වනු ඇත. මාසික වැටුප් ක්‍රමයේ තැබීමෙන් පසු විශ්‍රාම වැටුප් හිමි තත්ත්වය ලැබෙන තුරු රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. විශ්‍රාම වැටුප් හිමි තත්ත්වය ප්‍රදානය කිරීමෙන් පසු වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

තවද, අංක 765 හා 1969. 6. 9 වැනි දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ 2 වන ඡේදයේ "අ" සහ "ආ" යන වගන්තිද අදාල වනු ඇත.

3. වැටුප් (ඒකාබද්ධ වැටුප).—(අ) කොළඹ නාගරික සීමාව සහ නාගරික සීමාවේ සිට සැතපුම් 5ක අරය තුළ වූ ප්‍රදේශය තුළ හෝ ඉංජිනේරු හෝ කර්මාන්තශාලීය හෝ ආයතනයක් හැටියට භාණ්ඩාගාරය විසින් පිළිගෙන ඇති හෝ ආයතනවල සේවය කරන්නවුන් සඳහා :—

පළමු හය මස තුළ වැඩ කරන දිනකට රු. 10.70 බැගිනි. ඉන්පසු වර්ෂයකට රු. 3,240—12×60—3,960 වැටුප් ක්‍රමය අදාල වේ.

(ආ) පිට පළාත්වල ඉංජිනේරු හා කර්මාන්තශාලීය ආයතන හැටියට භාණ්ඩාගාරය විසින් පිළිගනු නොලැබ ඇති ආයතනවල සේවය කරන්නවුන් සඳහා :—

පළමු හය මස තුළ වැඩ කරන දිනකට රු. 9.70 බැගිනි. ඉන්පසු වර්ෂයකට රු. 3,060—9×60—රු. 3,600 වැටුප් ක්‍රමය අදාල වේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—(i) වයස : සෑම අයදුම්කරුවෙක්ම 1970 ජූලි 1 වැනි දිනට වයස යටත් පිරිසෙයින් අවුරුදු 25ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය. දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

(ii) අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :—

(අ) හත්වන ප්‍රමාණය සමත්ව සිටිය යුතුය.

(ආ) විදුලි ආලේපන බඳුන් සූදානම් කර ගැනීමේදී පාවිච්චි ගනු ලබන විවිධ වර්ගයේ ලවන රසායන ද්‍රව්‍ය හා ධන විදුලි සංවාහයන් (ලෝහ) පිළිබඳ සමානුපාතයන් ගැන හොඳ දැනුමක් තිබිය යුතුය.

(ඇ) පිරිසිදු කිරීමේ බඳුන් සහ විදුලිය අලේපනය කිරීමේ බඳුන් සූදානම් කර ගැනීම ඇතුළුව නියමිත භාණ්ඩ නිකල් ආලේපනය කිරීම හෝ ක්‍රෝමියම් ආලේපනය කිරීම හෝ පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.

(ඇ) පිළිගත් ආයතනයක විදුලි ආලේපකරුවෙක් වශයෙන් අවුරුදු 5කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

තවද, ඉහත සඳහන් සුදුසුකම්වලට අතිරේකව පහත දැක්වෙන සුදුසුකම්ද තිබිය යුතුය. ඒවා දක්වා ඇත්තේ වැඩි සැලකිල්ලක් ලබන අනුපිළිවෙලිනි.

(i) පිළිගත් ආයතනයක පළවෙනි පන්තියේ අදාල වෘත්තීයකරුවෙකු වශයෙන් අවුරුදු 6කට නොඅඩු සේවයක් සහිතව අදාල වෘත්තීයකරුවෙකු වශයෙන් අවුරුදු 10කට නොඅඩු සේවයක් තිබීම. (සහතිකපත් මගින් සනාථ කළ යුතුය.)

(ii) මනා චරිතයකින් යුක්තවීම. (වගකිවයුතු පුද්ගලයින් අත්සන් කළ චරිත සහතික ඉදිරිපත් කළ යුතුය.)

**සටහන.**—එක්සත් රාජධානි කඳවුරුවල වෘත්තීයකරුවෙකු වශයෙන් කළ සේවය පිළිගත් ආයතනයක සේවය වශයෙන් පිළිගනු ලැබේ.

5. නියම කරනු ලබන අවස්ථාවකදී අයදුම්කරුවන් පහත සඳහන් සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය :—

(i) උප්පැන්න සහතිකය හෝ රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනු ලැබූ හෝ වයස පිළිබඳ විශේෂ සහතිකයක්.

(ii) අධ්‍යාපන සහතිකය.

(iii) කාර්මික සුදුසුකම් සනාථ කිරීමේ සහතික.

(iv) චරිත සහතික.

6. දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින අය විසින් එවනු ලබන ඉල්ලුම්පත් ඔවුන් සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. එවැනි ඉල්ලුම්පත් නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබුණහොත් ඒවා ප්‍රතික්ෂේප නොකිරීමට නම්, දෙපාර්තමේන්තුවලට ඒවා කලට වේලාවට ලැබී තිබිය යුතු අතර, ඒවා මෙහි ඉදිරිපත් කිරීමට සිදුවූ ප්‍රමාදය ගැන පිළිගත හැකි හේතූන් දෙපාර්තමේන්තු ප්‍රධානීන් සඳහන් කර තිබිය යුතුය.

7. ඉල්ලුම්පත් හා ඒ පිළිබඳ වෙනත් ලිපි ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ තැනට හැර, මාගේ හෝ මෙම දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියෙකුගේ හෝ පෞද්ගලික නමට නොඑවිය යුතුය.

8. ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රජයේ සේවයට පත් කිරීම් සම්බන්ධව අදාල වන පොදු කොන්දේසි කෙරෙහිද, අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

ලුවී ගුණවර්ධන,
ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

1970 මැයි මස 8 වැනි දින,
කොළඹ 7, ග්‍රාම සංවර්ධන සහ
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ දීය.

## ඉල්ලුම් පත්‍රය

### ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

### විදුලි ලෝහලේපක තනතුර

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
අගට යෙදෙන නම නොහොත් වාසගම :————.
වෙනත් නම් :————.

2. ලිපිනය :————.

3. (අ) උපන් දිනය හා 1970 ජූලි 1 වැනි දිනට වයස :————.
(ආ) විවාහක අවිවාහක බව :————.

4. (අ) පුරවැසි බව හා එය ලබාගත් අන්දම (පරම්පරාවෙන් ලාංකිකයෙක් ද නැතහොත් ලියාපදිංචි කරනු ලැබීමෙන් ලාංකිකයෙක් ද යන බව සඳහන් කරන්න.) ————.
(ආ) ලාංකිකත්වය පෙළපතින් නම්, පහත සඳහන් අය උපන් ස්ථාන දක්වන්න :—
(අ) අයදුම්කරු :————.
(ආ) අයදුම්කරුගේ පියා :————.
(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.
(ඈ) අයදුම්කරුගේ පියාගේ පියාගෙ පියා :————.

5. ලබන ලද උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර :————. (විෂයයන් හා සමත්වූ දිනයන්ද සහිතව)

6. ඉගෙන ගත් පාසල හා ඉන් අස්වූ දිනය :————.

7. ලබාගත් කාර්මික සුදුසුකම් පිළිබඳ සම්පූර්ණ විස්තර (මෙම නිවේදනයේ 4 වැනි ඡේදය අනුව තමාට ඇති සුදුසුකම් මෙහි සඳහන් කරන්න.) :————.

8. කරන ලද රැකියාවන් හා එම සේවා කාල පිළිබඳ සම්පූර්ණ විස්තර :————.

9. කියවීම ලිවීම හා අර්ථ නිරූපණය පිළිබඳ ප්‍රවීණතාවය :—
(i) සිංහල :————, (ii) දෙමළ :————, (iii) ඉංග්‍රීසි :————.

10. විශේෂ සුදුසුකම් ඇත්නම්, ඒ පිළිබඳ විස්තර (වෘත්තීය හා කාර්මික) :————.

11. චරිත සහතික ලබාගත් අයගේ නම්, ලිපිනයන් හා තනතුරු : ————.

12. අයදුම්කරු පෞද්ගලිකව හඳුනන දෙදෙනෙකුගේ නම්, තනතුරු හා ලිපිනයන් :————.

13. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකමක් වේනොත්, ඒ පිළිබඳ විස්තර :————.

මා විසින් ඉහත සඳහන් කරන ලද සියලුම විස්තර සත්‍ය ඒවා බවත්, ඒවා නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසිම කරුණක් අසත්‍ය හෝ වැරදි හෝ බව තෝරාගනු ලැබීමට පෙර එළිදරව් වුවහොත්, මා නුසුදුස්සකු වෙනවා පමණක් නොව පත්වීමෙන් පසුව අනාවරණය වුවහොත් කිසිම වන්දි මුදලක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම හොඳාකාරව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

6–12—70.6.5 දින අංක 14,909 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

### ඇබෑර්තු

### බී—3 ශ්‍රේණියේ ලඝු/යතුරු ලේඛක (ඉංග්‍රීසි) තනතුර

මෙම සංස්ථාවේ ඉහත සඳහන් තනතුරේ පුරප්පාඩු සඳහා ලාංකික පුරවැසියන්ගෙන් අයදුම් පත් මෙයින් කැඳවනු ලැබේ.

2. අයදුම්පත් 1970 ජූනි මස 20 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන සේ,

සේවක මණ්ඩල කළමනාකාරතැන,
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව,
113, ගාලු පාර,
කොළඹ 3 යන ලිපිනයට ලියාපදිංචි කල තැපැලෙන් එවිය යුතුය.

ඉල්ලුම් පත්‍රය බහාලන කවරයේ ඉහල වම් කෙලවරේ "(ඉංග්‍රීසි) ලඝු-යතුරුලේඛක තනතුර" යනුවෙන් සඳහන් කළ යුතුය.

3. මෙම තනතුරට අදාල වැටුප් ක්‍රමය රු. 265—525 $7 \times 10$; $6 \times 15$; $5 \times 20$ වේ.

4. මෙහි දක්වා ඇති වැටුප් පරිමාණය ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් වේ.

5. මෙම දැන්වීමෙහි සඳහන් අවශ්‍යතාවයනට අනුකූලව පිළියෙල නොවුනු ඉල්ලුම් පත් කිසිදු දැන්වීමක් නොකර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. ඉල්ලුම් පත් ලැබුනු බව දන්වනු නොලැබේ.

7. රජයේ දෙපාර්තමේන්තුවල හෝ රජයේ අනෙක් සංස්ථාවන්හි හෝ සේවකයින් විසින් එවනු ලබන අයදුම් පත් සලකා බලනුයේ, ඔවුන් විසින් ඒවා අදාල දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළහොත් පමණි. භාණ්ඩාගාරයේ අංක 666 හා 1965. 8. 20 වෙනි දින දරන චක්‍ර ලේඛයෙහි දැක්වෙන වගන්තිවලට අනුව අදාල නිලධාරියා සිය සේවයෙන් නිදහස් කළ හැකිදැයි යන්න දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ ප්‍රධානියා විසින් සඳහන් කළ යුතුය.

8. ලඝුලේඛනය සහ යතුරු ලියනය පිළිබඳව අයදුම්කරුවන්ගේ ප්‍රවීනත්වය පරීක්ෂා කිරීම සඳහා කොළඹ, ලංකා කාර්මික විද්‍යාලයේදී විභාගයක් පවත්වනු ලැබේ. මේ සඳහා සෑම අයදුම්කරුවෙක්ම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව නමින් රු. 5 වටිනාකම ඇති මුදල් ඇණවුම් පතක් හෝ තැපැල් ඇණවුම් පතක් ඉල්ලුම් පත සමග එවිය යුතුය.

විභාගය පවත්වන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

9. සේවා කොන්දේසි :—

(i) තෝරාගනු ලබන අයදුම්කරුවන් :

(අ) පත්වීමට පෙර ශාරීරික යෝග්‍යතාව දක්වීම සඳහා වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතුය.

(ආ) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම් වස් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරනු ලබන ප්‍රමාණයක සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් ලබාගත යුතුය.

(ඉ) සේවක අර්ථසාධක අරමුදලට සිය වැටුපෙන් සියයට දහය (10%)ක් දායක විය යුතුය. ඊට සංස්ථාවෙන් සියයට පහළොව (15%)ක් දායක වනු ඇත.

(ඊ) සංස්ථාවේ ඕනෑම කාර්යාංශයක් යටතේ දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීම අවශ්‍යය.

(ii) මෙම තනතුර සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් තුන් අවුරුදු ආධුනික කාලසීමාවකට යටත්ව පත්කරනු ලැබේ.

**අවශ්‍ය සුදුසුකම් :—**

**අයදුම්කරුවන් :**

(අ) ජ්‍යෙෂ්ඨ හෝ අ. පො. ස. (සාමාන්‍ය) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව ඇතුලුව විෂයයන් හයකින් සමත්වී තිබිය යුතුයි.

(ආ) අඩු වශයෙන් මිනිත්තුවකට වචන 80 ක වේගයෙන් ලඝු ලේඛනය කිරීමට හා මිනිත්තුවකට වචන 40 ක වේගයෙන් යතුරුලිවීමට හැකිවිය යුතුයි.

(ඉ) වයස අවුරුදු 35 ට වැඩි නොවිය යුතුයි.

සේවක මණ්ඩල කළමනාකාරතැන.

1970. 5. 25 දින,
113, ගාලුපාර.
කොළඹ 3.

6–79—70.6.5 දින අංක 14,909 දරන ගැසට් පත්‍රය

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## යුද්ධ හමුදා මූලස්ථානය

1970 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1971 සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා වූ කාලසීමාව තුල :—

(අ) සීලාවතුරේ, අම්පාරේ සහ වෙම්පන්කුන්ඩු පිහිටා ඇති යුද හමුදාවේ කඳවුරුවලට එළවලු, පලතුරු, පොල්, ගොවි නිෂ්පාදන ද්‍රව්‍ය මස් වර්ග සහ අලුත් මාලු වර්ග සැපයීම,

(ආ) යාපනය, මන්නාරම, මුලතිව්, සීලාවතුරේ, වෙම්පන්කුන්ඩු සහ අයියකච්චි පිහිටා ඇති යුද හමුදා කඳවුරුවලට පලාපු දර සැපයීම,

(ඇ) යාපනය, මන්නාරම, මුලතිව්, සීලාවතුරේ, වෙම්පන්කුන්ඩු සහ අයියකච්චි පිහිටා ඇති කඳවුරුවල බැරැක්ක හා ආරෝග්‍ය ශාලා රෙදිපිළි හා සෙසු නිලයින්ගේ රෙදිපිලි සේදීම,

සඳහා 1970 ජූනි මස 21 වෙනි දින පෙරවරු 10 දක්වා, කොළඹ බාලදක්ෂ මාවතේ, යුද හමුදා මූලස්ථානයේ, ටෙන්ඩර් මණ්ඩලයේ, සභාපති විසින් ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

ටෙන්ඩර්පත් ලබා ගැනීම සඳහා යුද හමුදා මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරි වෙත ඉහත සඳහන් එක් එක් සැපයීම් පිණිස නැවත ලබාගත හැකි රු. 75 මුදලක් (චෙක්පත් භාරගනු නොලැබේ) තැන්පත් කර තිබිය යුතුය. පූර්වෝක්ත සැපයීම් පිළිබඳව ටෙන්ඩර් පත්‍රිකා 1970 ජූනි මස 20 දින දහවල් 12 දක්වා යුද හමුදා මූලස්ථානය විසින් නිකුත් කරනවා ඇත. වැඩි විස්තර කොළඹ, බාලදක්ෂ මාවතේ පිහිටි යුද හමුදා මූලස්ථානයෙන් දැනගත හැකිය.

සී. එච්. ආටිගල,
මේජර් ජනරාල්,
යුද්ධ හමුදා ආඥාපති.

1970 මැයි මස 26 වෙනි දින,
යුද හමුදා මූලස්ථානය,
බාලදක්ෂ මාවත,
තැ. පෙ. 553,
කොළඹදීය.

6–71—70.6.5 දින අංක 14,909 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුව

පුත්තලමේ පිහිටි, කැලෑ දෙපාර්තමේන්තුවට අයත් පැරණි සංචාරක බංගලාව මිලට ගෙන කඩා ඉවත් කරගෙන යාම සඳහා 1970.6.16 දින දහවල් 12 දක්වා කුරුණෑගල වයඹ දිසාභාර වන නිලධාරි විසින් මිළ ගණන් භාරගනු ලැබේ. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් ෆෝර්ම ලබාගැනීම සඳහා රු. 100 ක් කුරුණෑගල දිසාපති වෙත තැන්පත් කළ යුතුවේ.

ගොඩනැගිල්ල පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය වෙතොත් පුත්තලම අඩවි වන නිලධාරි විමසන්න. වැඩි විස්තර මගෙන් ලබාගත හැකිය.

ඊ. සී. ද ඉසෙඩ්. වීරවර්ධන,
වයඹ දිසාභාර වන නිලධාරි, කුරුණෑගල.

1970.5.8,
කුරුණෑගල.

6–32—70.6.5 දින අංක 14,909 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—කොළඹ උප කොටස

කොළඹ උප කොට්ඨාශයේ පහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් 1970 ජූනි මස 28 වන ඉරිද පෙරවරු 11 දක්වා ජාවත්ත පාරේ, කොළඹ 5, බස්නාහිර උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් බාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවලේම සිදුකෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ එම වැඩය ඉදිරියේ දක්වා ඇති අයුරු හෝ ඊට වැඩි ගණන්වලට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක :—

| වැඩයේ නම | කොන්ත්‍රාක්කරු ලියාපදිංචිවූ ගණන | | ටෙන්ඩර් තැන්පත් මුදල |
|---|---|---|---|
| | රු. | | රු. |
| කැළණි උතුරු බැම්ම අළුත්වැඩියා කිරීම | 40,000 | ... | 50 |

3. 1970 ජූනි මස 25 වෙනිද දක්වා කායඨාල වේලාවන් තුළදී කොළඹ, කළුතර, ගම්පහ, රත්නපුර වාරිමාර්ග ඉංජිනේරුවන්ගේ කායඨාලයන් ගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මවල ටෙන්ඩර් අයදුම් පත සකස් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ ඔවුන් දැනට කරන වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශනයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද, නැද්ද, යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුයි. පෝර්ම නිකුත් කිරීමට පෙර එම වැඩය ඉදිරියෙන් සඳහන් කර ඇති පරිදි ටෙන්ඩර් තැන්පත් මුදල් වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ කායඨාල වලදී හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් 1970 ජූනි මස 25 වෙනි දින හෝ ඊට පෙර කායඨාල වේලාවන් තුළදී ඉදිරිපත් කළ යුතුයි.

4. මෙම වැඩය ගැන සියළුම විස්තර, සැලසුම් ආදිය හා කායඨාල වේලාවන් තුළදී කොළඹ වාරිමාර්ග කායඨාලයෙන් ලබාගත හැක.

අයි. එච්. පෙරේරා,
වාරිමාර්ග ඉංජිනේරු,
කොළඹ උප කොටස.

වාරිමාර්ග කායඨාලය,
ජාවත්ත පාර, කොළඹ 5,
1970 මැයි මස 22 වැනි දින.

6–22—70.6.5 දින අංක 14,909 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කුණ්ඩසාලේ පාසැල් ගොවිපලෙහි ශීතකර කාමර සෑදීම

කුණ්ඩසාලේ පාසැල් ගොවිපලෙහි කිරි හා කිරි නිෂ්පාදන සකස් කිරීම සඳහා ශීතකර කාමර ඉදි කිරීම උදෙසා ටෙන්ඩර් 1970 ජූලි මස 19 වන දින ප. ව. 2.30 දක්වා පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්ත මේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පිටපත් දෙකකින් ඉදිරිපත් කළයුතු අතර ඒවා අත්සන් කොට එකම කවරයක බහා මුද්‍රා තබා ලියුම් කවරයේ වම් උඩ කෙළවරේ "කුණ්ඩසාලේ පාසල් ගොවිපලේ ශීතකර කාමර සෑදීම සඳහා ටෙන්ඩර්" යන්න සඳහන් කොට පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා වෙත එවිය යුතුයි. ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුත්තේ පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු ගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල වන අතර, ටෙන්ඩර් සම්බන්ධ විස්තර හා අනිකුත් විස්තර එම නිලධාරි තැනගෙන් ලබාගත හැක.

3. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය ශීතකර කටයුතු සඳහා රු. 50,000 ට නොඅඩු මුදලකට රජයේ දෙපාර්ත මේන්තුවක, මණ්ඩලයක හෝ සංස්ථාවක ලියාපදිංචිවී සිටින ටෙන්ඩර්කරුවන් විය යුතුයි.

4. ටෙන්ඩර් ආකෘති පත්‍ර පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කිරීමට යටත්ව 1970.7.17 වැනිදා දවල් 12 වන තෙක් නිකුත් කරනු ලැබේ :—

(අ) ඉහත 3 වැනි ඡේදයේ පරිදි ලියාපදිංචිය පිළිබඳ සාක්ෂි.

(ආ) රු. 100 සඳහා වූ ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය.

5. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්ත මේන්තුවේදී හෝ කච්චේරියක හෝ කොළඹ යෝක් වීදියේ ලංකා බැංකුවේ හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂ ගේ අංක 37 දරන ගිණුමට බැරකළ යුතුයි.

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1970 මැයි මස 23 වන දින,
පේරාදෙණියේ,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දීය.

6–56—70.6.5 දින අංක 14,909 දරන ගැසට් පත්‍රය

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව—මොණරාගල දිස්ත්‍රික්කය

### සුළුවාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර්

මෙම කාර්යාලයේ, පළාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන් ගෙන් හා විවිධසේවා සමුපකාර සමිති, ග්‍රාමසංවර්ධන සමිති හා කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි වී ඇති අනිකුත් සමුපකාර සමිතිවලින් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

#### වැඩ ලැයිස්තුව

| | | | | |
|---|---|---|---|---|
| 1. වැල්ලවාය ග.ව.නි. කොටස | ... | 1. | නිකාර වැව ඇල කැපීම | ... තණමල්විල ගො.කා.ස. |
| 2. බුත්තල ග.ව.නි. කොටස | ... | 2. | අරඹේයාය අමුණ සංවර්ධනය | ... කොටිකම්බොක්ක ගො.කා.ස. |
| 3. බඩල්කුඹුර ග.ව.නි. කොටය | ... | 3. | ඇත්පට්ටිය ඇල ප්‍රතිසංස්කරණය | ... මියනකඳුර ගො.කා.ස. |
| | | 4. | උඩඅරාව ඇල දියුණු කිරීම | ... වැකුඹුර–යාකුරාව ගො.කා.ස. |
| | | 5. | උල්විට ඇල ප්‍රතිසංස්කරණය | ... හිඟුරුකඩුව ගො.කා.ස. |
| 4. මඩුල්ල ග.ව.නි. කොටස | ... | 6. | තම්පලාගම අමුණ තැනීම | ... මකුල්ල ගො.කා.ස. |
| 5. මොණරාගල ග.ව.නි. කොටස | ... | 7. | ඉඩංගෙදර අමුණ ප්‍රතිසංස්කරණය (ගංවතුර හානි) | ... ඔබ්බෙගොඩ ගො.කා.ස. |
| | | 8. | හද්දවෙල ඇල දියුණු කිරීම | ... මොණරාගල ගොකා.ස. |
| | | 9. | මහගංගොඩ අමුණ ප්‍රතිසංස්කරණය | ... මොණරාගල ගො.කා.ස. |
| | | 10. | කුඹුක්අරාව වැව ප්‍රතිසංස්කරණය (ගංවතුර හානි) | ... මොණරාගල ගො.කා.ස. |
| | | 11. | කිරිවැව ප්‍රතිසංස්කරණය (ගංවතුර හානි) | ... මොණරාගල ගො.කා.ස. |
| | | 12. | සිරිගල මහයාය අමුණ ප්‍රතිසංස්කරණය (ගංවතුර හානි) | ... මොණරාගල ගො.කා.ස. |
| 6. මැදගම ග.ව.නි. කොටස | ... | 13. | නාවියාගේ වැව ප්‍රතිසංස්කරණය | ... කොටබෝව ගො.කා.ස. |
| | | 14. | මැදගම ඇල රෙගුලේටරය තැනීම | ... මැදගම ගො.කා.ස. |
| | | 15. | ගංගොඩවත්ත අමුණ තැනීම | ... නන්නපුරාව ගො.කා.ස. |
| | | 16. | පිටකුඹුර ඇල දියුණු කිරීම | ... අලංමුල්ල ගො.කා.ස. |
| | | 17. | පල්ලේඅරාව අමුණ තැනීම | ... දඹගෝනිය ගො.කා.ස. |
| | | 18. | තිඹිරියවැව ප්‍රතිසංස්කරණය (ගංවතුර හානි) | ... අලංමුල්ල ගො.කා.ස. |
| | | 19. | පිටදෙනිය ඇල ප්‍රතිසංස්කරණය (ගංවතුර හානි) | ... මැදගම ගො.කා.ස. |
| 7. බිබිල ග.ව.නි. කොටස | ... | 20. | මහයායේ අඩලේඇල දියුණු කිරීම | ... යල්කුඹුර ගො.කා.ස. |
| | | 21. | හිඹිලියගහ අරාව II දියුණු කිරීම | ... කොටගම ගො.කා.ස. |
| | | 22. | හෙනගහවෙල ඇල II ප්‍රතිසංස්කරණය | ... කුරගම්මන ගො.කා.ස. |
| | | 23. | කුරුවාඹේ ඇල ප්‍රතිසංස්කරණය | ... බදුල්ලගම්මන ගො.කා.ස. |
| 8. දෙඩම්ගොල්ල ග.ව.නි. කොටස | ... | 24. | කෝන්ගහකුඹුර පෝටාව තැනීම | ... ඉකිරියම්පොල ගො.කා.ස. |
| | | 25. | වටවන පෝටාව තැනීම | ... ඉකිරියම්පොල ගො.කා.ස. |
| | | 26. | වරකාවෙල පෝටාව තැනීම | ... ඉකිරියම්පොල ගො.කා.ස. |
| 9. මහඔය ග.ව.නි. කොටස | ... | 27. | උඩවැව ප්‍රතිසංස්කරණය | ... පදියතලාව ගො.කා.ස. |
| | | 28. | අස්වැද්දුම අමුණ තැනීම | ... පදියතලාව ගො.කා.ස. |

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසි වලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1970 ජූනි මස 10 දින දවල් 12 දක්වා මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළයුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචනවලින් ද, දක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිකානුකූලවද නිවැරදි වියයුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සෑමෙකක්ම ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොද සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොද, සීල් තබන ලද ලියුම් කවරවල බහා, මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ වම් කෙළවරේ ''මොණරාගල දිස්ත්‍රික්කයේ............සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය'' යනුවෙන් සඳහන් කළයුතුය. ටෙන්ඩර් පත්‍ර, 1970 ජූනි මස 14 දින දවල් 12 ට පෙර මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති ''ටෙන්ඩර් පෙට්ටියට'' දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරි තැන විසින් හෝ ලියවිල්ලකින් දනුම් දෙනු ඇත. මේ දනුම්දීම නිකුත් කළ දින සිට, දස දිනක් ඇතුලත දී එම ටෙන්ඩර් කරු විසින් මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුලත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදයක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 10%ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත්වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂෙප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමක් සමඟ නම ඇතුළත් වී ඇති කිසිවකු සමඟ හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතුන් උඩ, මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමඟ හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුළදී සැලසුම් පරීක්ෂා කර බැලීමට මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂාකර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුළදී මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන්ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගතයුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. '' ලාංකික '' යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අයයි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමඟ ගිවිසුමකට ඇතුළත් වියයුතුය. '' ගොවිජන සේවා සහකාර කොමසාරිස් '' යනුවෙන් හැඳින්වෙන්නේ දනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු වියයුතු මුද්දර කොන්ත්‍රාත් කරු විසින් සැපයිය යුතුය.

13. මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1970 ජූනි මස 15 දින පෙ.ව. 10 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර්කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

ඩබ්ලිව්. පී. ඩබ්ලිව්. වීරවර්ධන,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්.

මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන ගේ කාර්යාලය,
1970 මැයි මස 25 දින දීය.

6-112—70.6.5. දින අංක 14,909 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මාතර කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1970 ඔක්තෝබර් මස 1 දින සිට 1971 සැප්තැම්බර් 30 වැනිද දක්වා (දින දෙකම ඇතුළුව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයින් ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර මාතර පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සමාගම හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, පුත්තලම, මාතලේ, රත්නපුර සහ වවුනියා යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරීන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝරමයේ නොවන මොනම ටෙන්ඩර්යක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝරම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කර්න ලද කුවිතාන්සියක් ඉල්ලුම් පතට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝරම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝරම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල් වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට සැලකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝරම ලබාගැනීමට කැමැති සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුය. ඒ සඳහා උවමනා පෝරම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැකිය. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දනගැනීමට මේ සමග ඇති උපලේඛනයේ 5 වන තීරය බලන්න. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුට රෝගීන් සහ සේවකයින් විසින් භාරදී ඇති කූපන් වෙනුවෙන් සහනමිල යටතේ හෝ නොමිලයේ හෝ 1966.12.19 දින සිට පවතින ක්‍රමයට අවශ්‍ය සහල් ආහාර දෙපාර්තමේන්තුවෙන් ලබාගැනීමට ආයතන භාර ප්‍රධානියා විසින් බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා '' සෞඛ්‍ය සේවා අධිකාරි, මාතර '' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක්දැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයෙහි තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පෞද්ගලිකව මට හෝ ගණකාධිකාරි/ලේකම් තැනට භාරදෙන්නේ නම් ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

6. **ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර පත් භාරගැනීම අවසන්වූ වහාම ඒවා මෙම කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට එම ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිල ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කලින් පිළියෙල කර ගත් දිනක මා විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව එවායේ පිටපතක් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි තීරණය.**—ටෙන්ඩර්පත් තෝරනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝරමයෙහි ''බී'' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිල ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝරමයෙහි ''සී'' උපලේඛන යට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිල ගණන් සඳහන් කළ යුතුය. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිල ගණන් හෝ එවකට වෙළඳ පොලේ පවතින මිල ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිලක් පවතී නම් එම පාලන මිල ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිල ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමුවෙනි ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන් තබන ලද පොරොන්දු පත්‍රයේ විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් මුදල.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයේ 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩු බාහිරාදිය තබාගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබාගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසිද ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතුය.

වෛද්‍ය අයි. ඒ. ඇස්. සිරිවර්ධන,
මාතර සෞඛ්‍ය සේවා අධිකාරි.

1970 මැයි මස 19 වැනි දින,
මාතර සෞඛ්‍ය සේවා අධිකාරි කාර්‍යාලයේ දීය.

## උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් තැන්පත් මුදල රුපියල් | (3) ඇප මුදල රුපියල් | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | (5) ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් — සේවකයින්ට: අළුත් මාළු | සේවකයින්ට: හරක් මස් | සේවකයින්ට: කරවල | සේවකයින්ට: එළවළු | රෝගීන්ට: අළුත් මාළු | රෝගීන්ට: හරක් මස් | රෝගීන්ට: කරවල | රෝගීන්ට: එළවළු | රෝගීන්ට: කිරි ආහාර |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අකුරැස්ස ගැමි රෝහල හා මාතෘ නිවාසය ... ... | 100... | 800 | 1970 ජූලි මස 9 දින පෙරවරු 10.00 ට | 150... | 150... | 150... | 600... | 2,350... | 2,350... | 2,400... | 9,600... | 4,000 |
| අකුනකොළ පැලැස්ස ගැමි රෝහල හා මාතෘ නිවාසය ... ... | 100... | 600 | | 250... | 250... | 250... | 1,050... | 1,000... | 1,100... | 1,000... | 4,100... | — |
| බැරගම ගැමි රෝහල හා මාතෘ නිවාසය ... ... | 100... | 400 | | 100... | 100... | 100... | 450... | 600... | 550... | 600... | 2,300... | — |
| දික්වැල්ල ගැමි රෝහල හා මාතෘ නිවාසය ... ... | 100... | 600 | | 100... | 100... | 100... | 300... | 800... | 800... | 800... | 3,200... | — |
| ගංගොඩගම ගැමි රෝහල හා මාතෘ නිවාසය ... ... | 100... | 800 | | 450... | 450... | 450... | 1,700... | 850... | 850... | 850... | 3,400... | — |
| කඹුරුපිටිය ගැමි රෝහල හා මාතෘ නිවාසය ... ... | 100... | 800 | | 350... | 350... | 350... | 1,400... | 2,100... | 2,100... | 2,100... | 8,850... | 4,200 |
| කාරියමඩිත්ත ගෘහ රෝහල ... | 100... | 600 | | 100... | 100... | 100... | 350... | 1,650... | 1,600... | 1,700... | 6,650... | — |
| කතරගම ගැමි රෝහල හා මාතෘ නිවාසය ... ... | 100... | 600 | | 450... | — ... | 900... | 1,750... | 2,300... | — ... | 4,600... | 9,200... | — |
| කටුවන ගැමි රෝහල හා මාතෘ නිවාසය ... ... | 100... | 800 | | 450... | 400... | 400... | 1,700... | 1,100... | 1,100... | 1,000... | 4,450... | — |
| මාවරල ගැමි රෝහල හා මාතෘ නිවාසය ... ... | 100... | 600 | | 400... | 400... | 400... | 1,700... | 950... | 1,000... | 1,000... | 3,900... | — |
| මීගහජඳුර ගැමි රෝහල හා මාතෘ නිවාසය ... ... | 100... | 400 | | 350... | 350... | 350... | 1,350... | 500... | 350... | 400... | 1,550... | — |
| මිදිගම ගැමි රෝහල ... | 100... | 600 | | 100... | 100... | 100... | 450... | 350... | 350... | 350... | 1,450... | — |
| මොරවක ගැමි රෝහල හා මාතෘ නිවාසය ... ... | 100... | 800 | | 150... | 150... | 150... | 600... | 2,100... | 2,200... | 2,200... | 8,600... | — |
| නරවැල්පිට ගැමි රෝහල හා මාතෘ නිවාසය ... ... | 100... | 600 | | 400... | 400... | 400... | 1,650... | 700... | 700... | 750... | 2,850... | — |
| රන්න ගැමි රෝහල හා මාතෘ නිවාසය | 100... , | 600 | | 100... | 100... | 100... | 400... | 850... | 900... | 850... | 3,600... | — |
| ඌරුබොක්ක ගැමි රෝහල ... | 100... | 600 | | 250... | 250... | 250... | 1,000... | 1,150... | 1,100... | 1,100... | 4,350... | — |
| වැලිගම රජයේ රෝහල ... | 100... | 800 | | 300... | 300... | 300... | 1,200... | 2,700... | 2,500... | 2,650... | 10,300 | 2,100 |

6–60—70.6.5 දින අංක 14,909 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—ගාල්ල කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1970 ඔක්තෝබර් 1 වනදා සිට 1971 සැප්තැම්බර් 30 වනදා දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ මේ සමඟ ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන් ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර ගාල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දී සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් හා විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරු වන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වක්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට සැළකිය යුතු කාලයකට ප්‍රථම තම වක්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වක්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල් අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දන ගැනීමට මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " සෞඛ්‍ය සේවා අධිකාරී, ගාල්ල ", කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර්පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාදැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර්පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියා පදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරී/ලේකම් තැනට භාරදෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

6. **ටෙන්ඩර් බාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර්පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම සහ ඔවුන් සඳහන් කරන ලද මිල ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කලින් පිළියෙල කරගත් දිනයක මා විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර්පත් තෝරා ගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ " බී " උපලේඛනයේ සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තුවන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම්වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටැන්ඩර් පෝර්මයෙහි " සී " උප ලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිල ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිල ගණන හෝ එවකට වෙළඳ පොළේ පවතින මිල ගණන හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිලක් පවතී නම් එම පාලන මිල ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිල ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් කරන ලද මිල ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත් වනතුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සළසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතු ද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසි ද ටෙන්ඩර් කරුවන් විසින් සැළකිය යුතුය.

ඩී. ජී. ඩී. ප්‍රනාන්දු,
සෞඛ්‍ය සේවා අධිකාරී, ගාල්ල.

1970 මැයි **22** වෙනි දින,
ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේ දී ය.

## උපලේඛනය

| | 1 | 2 | 3 | 4 | 5 | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල් | ඇප මුදල | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | ආහාර ප්‍රමාණය දළ වශයෙන් | | | | | | | |
| | | | | | සේවකයින්ට | | | | නොගෙවන රෝගීන්ට | | | |
| | | රුපියල් | රුපියල් | | මාළු | හරක් මස් | කරවල | එලවළු | මාළු | හරක් මස් | කරවල | එලවළු |
| 1. | අම්බලන්ගොඩ රජයේ රෝහල | 100... | 400 | | 160... | 160... | 160... | 700... | 1,700... | 1,700... | 1,700... | 6,600 |
| 2. | උනවටුන රජයේ රෝහල් ... | 100... | 800 | | 150... | 150... | 150... | 700... | 1,300... | 1,300... | 1,300... | 5,000 |
| 3. | හිනිදුම රජයේ රෝහල ... | 100... | 800 | 1970.7.10 | 270... | 270... | 270... | 1,100... | 1,900... | 1,900... | 1,800... | 7,500 |
| 4. | බද්දේගම පයෘීන්ත ඒකකය ... | 100... | 800 | දින | 40... | 40... | 40... | 170... | 1,400... | 1,300... | 1,400... | 6,000 |
| 5. | බොරකන්ද පයෘීන්ත ඒකකය ... | 100... | 600 | පෙරවරු | 125... | 125... | 125... | 500... | 1,200... | 1,200... | 1,200... | 5,000 |
| 6. | හික්කඩුව පයෘීන්ත ඒකකය ... | 100... | 600 | 10ට | 150... | 150... | 150... | 650... | 900... | 900... | 900... | 3,500 |
| 7. | ඉමදූව පයෘීන්ත ඒකකය ... | 100... | 800 | | 270... | 270... | 270... | 1,100... | 1,500... | 1,500... | 1,600... | 6,500 |
| 8. | ඉඳුරුව පයෘීන්ත ඒකකය ... | 100... | 600 | | 100... | 100... | 100... | 500... | 500... | 500... | 500... | 1,900 |

6–28—70.6.5 දින අංක 14,909 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—පිරිසිදු එළකිරි එහා මෙහා ගෙනයාම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා**—වර්ෂ 1970 ඔක්තෝබර් මස 1 වෙනිදා සිට 1971 සැප්තැම්බර් මස 30 වෙනිද දක්වා (දෙදින ඇතුළුව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන ආයතනයන්ට දුම්රිය ස්ථානවල සෞඛ්‍ය කායෲලවල/සිට කිරි මධ්‍යස්ථානවලට එළකිරි ගෙනයාම සඳහා ලාංඡිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම් විසින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම**.—රුපියල් 100ක තැන්පත් මුදලක්, මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර**.—ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කායෲලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරීවරුන්ගේ කායෲලවලින් හෝ ලබා ගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—මාස්පතා එහා මෙහා ගෙන යා යුතු පිරිසිදු එළකිරි ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමග ඇති උපලේඛනයෙහි 3 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " සෞඛ්‍ය සේවා අධිකාරී, ගාල්ල " කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාල යේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම මගේ ලේකම්/ගණකාධිකාරි මහතාට දීමෙන් ඒ ලැබුනු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන් සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි, පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත් වනු තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු ම විසින් නියම කරන ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් හැර පිළිපැදිය යුතුද වන්නේය.

11. **වෙනත් විස්තර.**—තවදුරටත් විස්තර දැන ගැනීම සඳහා මෙහි දෙවන ඡෙදයෙහි සඳහන් කුමන කාර්යාලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මගින් පුළුවන.

බී. ජී. ඩී. ප්‍රනාන්දු,
ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරී.

1970 මැයි 22 වෙනි දින,
ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දී ය.

## උපලේඛනය

| (1) සේවය | (2) ප්‍රදේශය | (3) ප්‍රමාණය පයින්ට් | (4) අවසාන දිනය |
|---|---|---|---|
| ගාලු කඩවත් සතර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කාර්යාලයේ සිට ගාලු කඩවත් සතර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | ගාල්ල | ... 12,000 | 70.7.15 පෙ. ව. 10 ට |
| බද්දේගම සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරි තැනගේ කාර්යාලයේ සිට බද්දේගම සෞඛ්‍ය කාර්යාල භාර නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | බද්දේගම | ... 10,000 | |
| අම්බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කාර්යාලයේ සිට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | අම්බලන්ගොඩ | ... 7,000 | |
| ඉඳුරුවේ සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරි තැනගේ කාර්යාලයේ සිට ඒ නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | ඉඳුරුව | ... 7,700 | |
| ඇල්පිටිය සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරි තැනගේ කාර්යාලයේ සිට ඒ නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | ඇල්පිටිය | ... 4,000 | |
| උණවටුනේ සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරි තැනගේ කාර්යාලයේ සිට ඒ නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | උණවටුන | ... 8,000 | |

6–27—70.6.5 දින අංක 14,909 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—කොළඹ කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1970.10.1 සිට 1970.9.30 වනදා දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ, මේ සමග ඇති උපලේඛණයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත් කොළඹ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේදී, සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති ඇතුළත් සංගම් හා විවිධ සේවා සංගම් වලට අයිති සමිති වලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වෙවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී වරුන්ගේ කාර්යාල වලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට සැළකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර්පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දැන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ (II) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දැන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට, මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " සෞඛ්‍ය සේවා අධිකාරී, කොළඹ " කියා එවිය යුතුය. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාදැයි පැහැදිලිව සඳහන් කළයුතුවාක් මෙන්ම එහි වම්පස කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර්පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැළැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරී/ලේඛකී තැනට භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණ බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනක ම විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ "බී" උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම්වන මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි "සී" උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන හෝ එවකට වෙළඳපොලේ පවතින මිළ ගණන හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සළසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසි ද ටෙන්ඩර් කරුවන් විසින් සැළකිය යුතුය.

1970 මැයි මස 29 වැනි දින,
සෞඛ්‍ය සේවා අධිකාරී කාර්‍යාලය,
නො. 83, කින්සි පාර,
කොළඹ 8.

එච්. සී. ගෝමස්,
කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරී.

## උපලේඛනය—1970-71

| | ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | ආහාර ප්‍රමාණය දළ වශයෙන් | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | සේවකයන්ට | | | | නොගෙවන ලෙඩුන්ට | | | |
| | | | | | මාළු | මස් | කරවල | එළවළු | මාළු | මස් | කරවල | එළවළු |
| | | රුපියල් | රුපියල් | | | | | | | | | |
| 1. | දිවුලාපිටිය රෝහල ... | 100... | 800 | 1970.6.21 දින පෙ.ව . 10 | 250... | 250... | 250... | 1,050... | 2,650... | 2,600... | 2,550... | 11,150 |
| 2. | ගොඩිගමුව ග්‍රාමීය රෝහල ... | 100... | 400 | | 50... | 50... | 50... | 50... | 450... | 450... | 450... | 150 |
| 3. | ජාඇල ග්‍රාමීය රෝහල ... | 100... | 400 | | 150... | 150... | 150... | 600... | 300... | 300... | 300... | 1,300 |
| 4. | කැළණිය ග්‍රාමීය රෝහල ... | 100... | 800 | | 300... | 300... | 300... | 1,200... | 600... | 600... | 600... | 2,400 |
| 5. | කොස්ගම ග්‍රාමීය රෝහල ... | 100... | 600 | | 300... | 300... | 300... | 1,250... | 250... | 250... | 250... | 950 |
| 6. | මිනුවන්ගොඩ ග්‍රාමීය රෝහල... | 100... | 600 | | 300... | 300... | 300... | 1,250... | 400... | 450... | 350... | 1,700 |
| 7. | රදාවාන ග්‍රාමීය රෝහල ... | 100... | 400 | | 150... | 150... | 150... | 700... | 600... | 600... | 450... | 2,300 |
| 8. | වේරවල ග්‍රාමීය රෝහල ... | 100... | 400 | | 150... | 150... | 150... | 500... | 200... | 200... | 200... | 850 |
| 9. | තලංගම ග්‍රාමීය රෝහල ... | 100... | 400 | | 550... | 550... | 550... | 2,350... | 500... | 500... | 500... | 2,200 |
| 10. | නවගමුව ග්‍රාමීය රෝහල ... | 100... | 400 | | 50... | 50... | 50... | 50... | 50... | 50... | 50... | 150 |
| 11. | පමුණුගම ග්‍රාමීය රෝහල ... | 100... | 400 | | 200... | 100... | 100... | 250... | 200... | 100... | 100... | 300 |
| 12. | අතුරුගිරිය ග්‍රාමීය රෝහල ... | 100... | 400 | | 50... | 50... | 50... | 50... | 50... | 50... | 50... | 50 |

6–114—70.6.5 දින අංක 14,909 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—කොළඹ කොට්ඨාශය

### කිළිටි රෙදි සේදීම

**සේවය සහ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්.**—1970.10.1 වැනි දින සිට 1971 සැප්තැම්බර් 30 වනදයින් (දින දෙකත් ඇතුළුව) අවසන් වන වර්ෂය තුළ මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමුවෙනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි සේදීම සඳහා ලාංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරී විසින් භාරගනු ලැබේ.

2. **ටෙන්ඩර් තැන්පත් මුදල්.**—(i) මෙම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම් වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්ලිය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිති වල ලියාපදිංචි කළ අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් ද ආයතනයන් භාර වෛද්‍ය නිලධාරීන්ගෙන් ද ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි.

ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු ආයතන භාර වෛද්‍ය නිලධාරියාට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ දෙවන කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහාපෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **සෝදනා කැලි ප්‍රමාණය පිළිබඳ විස්තර.**—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කැලි ප්‍රමාණය මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරී, කොළඹ'' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවද යන්න පැහැදිලිව සඳහන් කළයුතුවාක් දෙන්ම, එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර්පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරි/ලේකම් මහතාට (හෝ මාහට) දීමෙන් ඒ ලැබුණු බවට ඔහු/හෝ ම විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 6 තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිට පත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි සඳහන් කරන මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වළංගු වේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම්, එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාත් හැර පිළිපැදිය යුතුද වන්නේය.

11. **අතික් විස්තර.**—(i) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලි බලය, ජලය ආදී පහසුකම් සැලසුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදයම් පාලක නිලධාරිතුමා තක්සේරු කළ ගණන්වලට අනුව වවුචරයෙන් කපාගනු ලැබේ.

(ii) **කිළිටි රෙදිවල විෂබීජ නැති කිරීම සහ එහාමෙහා ගෙන යාමේ වියදම්.**—යම් අවස්ථාවක කිළිටි රෙදි සේදීමට පළමු ඒවායේ විෂබීජ නැති කිරීම සඳහා වෙන ස්ථානයකට ගෙනයාමට සිදුවුවහොත් ඒවා එහා මෙහා ගෙනයාමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) **පළාත් පාලන මණ්ඩලවල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පළාත් පාලන මණ්ඩල තුළ ඇති ආයතනයකට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ ඒ ඒ මණ්ඩලවල නීතිවලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන හිමි අයට පමණි.

(iv) ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් කොටසක් හෝ සෑම කොටසක්ම ඒවා නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ හැකිය.

එච්. සී. ගෝමස්,
කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරී.

සෞඛ්‍ය සේවා අධිකාරී කර්යාලය,
කොළඹ, 1970.5.29.

## උපලේඛනය—1970–71

| ආයතනය | ටෙන්ඩර් මුදල රු. | ඇප මුදල රු. | මසකට රෙදි සේදිය යුතු වාර ගණන | මසකට සේදිය යුතු කැලි ගණන සාමාන්‍යයෙන් | ටෙන්ඩර් භාර ගැනීම අවසාන වන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| 1. වතුපිටිවෙල රෝහල—කොටස් අංක 1 | | | | | |
| වාට්ටු අංක 1, 2, 3, 4, 5, 8, 9, ගෙවන වාට්ටු, මුළු තැන්ගෙය, දන්ත චිකිත්සාගාරය, පර්යේෂණාගාරය, ගිලන් රථ ගරාජය, බෙහෙත් හල ... | 100 ... | 200 ... | වාර 4 ... | 2,541 | 1970.6.23 දින පෙ.ව. 10 |
| කොටස් අංක 2 | | | | | |
| ළමා වාට්ටු සහ මාතෘ වාට්ටු අංක 6 සහ 7 ... | 100 ... | 200 ... | වාර 4 ... | 1,201 | |
| 2. දෙම්පේ රෝහල | | | | | |
| වාට්ටු අංක 1, 2, 3, 4, 5, බෙහෙත් හල, කායචිකිත්සාලය, මුළුතැන් ගෙය, ළමා සහ මාතෘ වාට්ටු ... | 100 ... | 200 ... | වාර 4 ... | 2,271 | |
| 3. දිවුලාපිටිය රෝහල | | | | | |
| වාට්ටු අංක 1 මාතෘ, 2 පිරිමි, 3 ගැනු වාට්ටු ... | 100 ... | 200 ... | වාර 4 ... | 1,150 | |
| 4. මීරිගම රෝහල | | | | | |
| වාට්ටු අංක 1 පිරිමි, 2 ළමා, 3 සහ 4 මාතෘ, 5 පිරිමි, 6 ගැනු ... ... ... | 100 ... | 200 ... | වාර 4 ... | 2,240 | |
| 5. අවිස්සාවේල්ල රෝහල කොටස් අංක 1 | | | | | |
| වාට්ටු අංක 1, 2, 4, 5, 6, 7, 8, 9, 10, 12, 13, 14 බෙහෙත් හල සහ බෝවෙන රෝගීන්ගේ වාට්ටුව ... ... | 100 ... | 200 ... | වාර 4 ... | 1,471 | |
| කොටස් අංක 2 | | | | | |
| මාතෘ වාට්ටුව සහ ළමා වාට්ටු සහ දන්ත චිකිත්සාගාරය ... ... | 100 ... | 200 ... | දිනපතා ... | 1,210 | |
| 6. ගම්පහ රෝහල කොටස් අංක 1 | | | | | |
| වාට්ටු 1 සහ 2, මාතෘ වාට්ටු 3, ළමා සහ ශල්‍යාගාරය ... ... | 100 ... | 200 ... | වාර 8 ... | 4,675 | |
| කොටස් අංක 2 | | | | | |
| වාට්ටු අංක 4, 5, 6, 7, 8, 9 සහ 11 ... | 100 ... | 200 ... | වාර 4 ... | 2,051 | |

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

දුම්රිය දෙපාර්තමේන්තුවට "ක්‍රෑංක් ෂාෆ්ට්" එකක් සැපයීම පිළිබඳව 1970.4.10 දින අංක 14,901 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලවූ නිවේදනයෙහි 1 වැනි හා 5 වැනි ඡේදයන් පහත සඳහන් පරිදි සංශෝධනය කර ඇති බැවි අදාළ සියළු දෙනාගේම දැනගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධ කරමි.

1 ඡේදය—දුම්රිය දෙපාර්තමේන්තුවට "ක්‍රෑංක් ෂාෆ්ට්" එකක් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 7, ප්‍රවාහණ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1970 ජූලි මස 9 වැනිදා පෙරවරු 11 තෙක් බාරගනු ලැබේ.

5 ඡේදය—1970 ජූලි මස 9 වැනිදා පෙරවරු 11.05ට ප්‍රවාහණ අමාත්‍යාංශ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඇම්. සරීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

1970.5.25 දින,
කොළඹ දීය.

6–39—70.6.5 දින අංක 14,909 දරන ගැසට් පත්‍රය

---

## දිසාපති කාර්‍යාලය—වවුනියාව

1970.5.15 වෙනි දින දරණ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කෙරුන 1970.6.2 දිනට නියමිතව තිබූ ඉදිකිරීම් වැඩ පිළිබඳ වූ ටෙන්ඩර් භාරගැනීමේ අවසාන දිනය 1970.6.16 වෙනි අඟහරුවාදා දහවල් 12 දක්වා දීර්ඝ කරන්නට යෙදුන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

බී. සී. පෙරේරා,
වවුනියාව දිස්ත්‍රික්කයේ දිසාපති.

1970.5.25 වෙනි දින,
දිසාපති කාර්‍යාලය,
වවුනියාව.

6–61—70.6.5 දින අංක 14,909 දරන ගැසට් පත්‍රය

---

## මඩකලපු කච්චේරිය

### 2 ශ්‍රී 4594 දරණ අබලන් 'විලීස්' ජීප් රථය විකිණීම

දැනට මඩකලපු කච්චේරි භූමියෙහි තිබෙන ඉහත සඳහන් අබලන් 'විලීස්' ජීප් රථය විකිණීම සඳහා 1970 ජූනි මස 16 වැනි දින පෙ. ව. 10 තෙක් මඩකලපු කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින්, සීල් තබා ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර් භාරගැනීම නතර කළ විගස එදිනම ටෙන්ඩර් පත් විවෘත කරනු ලබේ. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටීමට ඉඩ දෙනු ඇත.

රු. 500 ක මුදලක් මඩකලපු දිසාපති වෙත තැන්පත් කළ පසු මේ සඳහා අවශ්‍ය ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. 1970 ජූනි මස 15 වැනි දින දහවල් 12 දක්වා ටෙන්ඩර්පත් නිකුත් කරනු ඇත. ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපැලෙන් සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, කච්චේරිය, මඩකලපුව යන ලිපිනයට එවිය යුතුය. නැතහොත් පුද්ගලිකව පැමිණ මඩකලපු කච්චේරියේ කාර්යාල සහකාර තැනට භාර දිය යුතුය. ටෙන්ඩර් පත් බහා එවනු ලබන ලියුම් කවරයේ වම් පස ඉහල කෙලවරෙහි "2 ශ්‍රී 4594 සඳහා ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

වැඩ කරන ඕනෑම දිනක කාර්යාලීය වේලාවන් තුලදී මඩකලපු දිසාපති තුමාගේ අවසර පිට රථය කච්චේරි භූමියේ දී පරීක්ෂා කර බැලිය හැකිය.

ටෙන්ඩරය භාරගත් බවට දැනුම් දුන් දින සිට සතියක් ඇතුලතදී සාර්ථක ටෙන්ඩර්කරු විසින් තමා ටෙන්ඩර් කළ මුළු මුදල සම් පූර්ණයෙන්ම ගෙවා රථය කච්චේරි භූමියෙන් ඉවත් කර ගත යුතුය.

ඉදිරිපත් කරනු ලබන කිසියම් ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් කිසිම හේතුවක් නොදක්වා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය මඩකලපු කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති සතු වන්නේ ය.

වැඩිදුර විස්තර සඳහා මඩකලපු කච්චේරියෙන් විමසන්න.

කේ. ඊ. ජේ. එඩ්ගාර් ප්‍රනාන්දු,
අතිරේක දිසාපති,
මඩකලපුව දිසාපති වෙනුවට.

1970 මැයි මස 10 වැනි දින,
මඩකලපු දිසාපති කාර්යාලයේ දී ය.

6–68—70.6.5 දින අංක 14,909 දරන ගැසට් පත්‍රය

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම

## රා රේන්ද විකිණීම—කොළඹ දිස්ත්‍රික්කය, 1970/71

ඊ.එක්ස්. 15/69

1970 මාර්තු මස 20 දින අංක 14,898 දරණ රජයේ ගැසට් පත්‍රයේ පෙනෙන, රා රේන්ද විකිණීමේ කොන්දේසි හා දැනට වලංගුව පවතින සුරාබදු බලපත්‍ර සම්බන්ධ පොදු කොන්දේසි අනුව පැසුණු රා සිල්ලරට පහත දක්වෙන තැබෑරුම්වල 1970 ඔක්තෝබර් මස 1 දින සිට 1971 සැප්තැම්බර් මස 30 දින දක්වා තනි අයිතිය පිට විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. පහත දක්වෙන කාර්‍යාලයයන්ගෙන් ලබා ගත හැකි නියමිත පෝරම මාර්ගයෙන් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ, පහත පෙනෙන "ජී" තීරයේ එක් එක් තැබෑරුමට කෙළින් දක්වා තිබෙන නියමිත මුදල් තැන්පත් කළ බවට කච්චේරියෙන් ලබාගත් කුවිතාන්සියක් හා ප්‍රා.ආ.නි. ගෙන් ලබා ගත් වත්කම් සහතිකයක් ද සමගය. ප්‍රාදේශීය ආදායම් නිලධාරීන්ගෙන් ලබා ගන්නා ලද වත්කම් සහතික, එම සහතිකයන්හි උපලේඛනයන්හි ඇතුළත් එසේම එම සහතික නිකුත් කිරීම සඳහා පදනම් කරගත් කිසිදු දේපොලක් විකුණා නැතිනම්, එම වත්කම් සහතික නිකුත් කළ දින සිට අවුරුදු පහක කාලයක් සඳහා වලංගු වේ :

(ඒ) ඕනෑම කච්චේරියකින් ;
(බී) කොළඹ 7, සුරාබදු කොමසාරිස් කාර්‍යාලයෙන් ;
(සී) කොළඹ සුරාබදු මණ්ඩල කාර්‍යාලයය ;
(ඩී) කළුතර සුරාබදු මණ්ඩල කාර්‍යාලයය ;
(ඊ) හලාවත සුරාබදු මණ්ඩල කාර්‍යාලයය ;

3. සීල් තබන ලද කවරයක බහා ලූ එක් එක් ටෙන්ඩර් පත් ඇතුළත් කවරයේ උඩ වම්පස කෙළවරේ "අංක ........... දරණ රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය—කොළඹ දිස්ත්‍රික්කය, 1970/71" යනුවෙන් සඳහන් කර (අ) කොළඹ කච්චේරියේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ (ආ) ලියාපදිංචි තැපැලෙන්, කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තුමා වෙත එවීමෙන් හෝ මෙහි පහත සඳහන් උපලේඛනයේ ඒ ඒ තැබෑරුමට කෙළින් දක්වා ඇති වේලාවන් සහ දිනයන්හි දී හෝ ඊට පෙර හෝ ලැබෙන්නට සැලැස්විය යුතුය. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාවේදී කච්චේරියට පැමිණ සිටිය යුතුය.

4. තෝරාගත් ටෙන්ඩර්කරු, ඒ මොහොතේ ම ගැනුම්කරු වශයෙන් දැනුම් දෙනු ලබන අතර, ඉහත පෙනෙන රා රේන්ද විකිණීම කොන්දේසි ප්‍රකාර, 9 වෙනි කොන්දේසිය යටතේ වරප්‍රසාද විකිණීමේ කොන්දේසිය අත්සන් කිරීම සඳහා නියම කරනු ලබන මුදලක් තැන්පත් ඇප මුදල් වශයෙන් දිසාපතිතැනට ගෙවිය යුතුයි.

5. මිළයට ගන්නා හැටියට වරප්‍රසාදය ලැබූ යම් ටෙන්ඩර්කරුවෙක් විකිණීම පිළිබඳ කොන්දේසිවලට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කිරීමෙන් හෝ උවමනා කරන ඇප මුදල නියමිත අවස්ථාවේදී ඉදිරිපත් කිරීමට අපොහොසත් වීමෙන් ඔහු විසින් තබන ලද ටෙන්ඩර් තැන්පත් මුදලට අහිමියෙක් වන අතර වරදකරුවෙක් වශයෙන් ඔහුගේ නම සුරාබදු බලපත්‍ර සම්බන්ධ වරදකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නටද පුළුවන. මෙයට විශේෂයක් වශයෙන් සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින්, විකිණීම සම්බන්ධ කොන්දේසි අත්සන් කළ පසු ටෙන්ඩර්කරුවන් විසින් තැන්පත් මුදල් ආපසු දීම සහ ඉහත කී සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් තබන ලද ඇපය ආපසු ගෙවනු ලැබේ.

6. එකක් හෝ සියළුම ටෙන්ඩර්, එසේ කිරීමට කිසි කරුණක් නොදක්වාම ප්‍රතික්ෂේප කිරීමේ බලය ආණ්ඩුවේ ඒජන්තතුමාට තිබේ.

7. වැඩි විස්තර කොළඹ කච්චේරියෙන් ලබාගත හැක.

1970 මැයි මස 23 දින,
කච්චේරිය, කොළඹ.

ඩී. ආර්. උමගිලිය,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

ඉහත කී තැබෑරුම්වල

## අනුමත කරන ලද තැබෑරුම් ලැයිස්තුව—කොළඹ දිස්ත්‍රික්කය

කොළඹ නාගරික සභාව

| (ඒ) අනුක්‍රමික අංකය | (බී) ප්‍රදේශය | (සී) ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස) | (ඩී) ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාව පෙරවරු | (ඊ) තැබෑරුම් විවෘත කරන වේලාව පෙරවරු | (ඈ්ප්) තැබෑරුම් වසන වේලාව පස්වරු | (ජී) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල රු. | (එච්) විකිණීම කරන දිනය |
|---|---|---|---|---|---|---|---|
| 1 ... | නො. 5 කොට්ඨාශය, කොටහේන බටහිර (කෝටබෝම්) | පෙදෙස මෙසේ සීමා වී තිබේ :—උතුරට : ස්කිනර් පාරේ දකුණු පෙදෙස් සන්ධියේ සිට, කෝටබෝම් වීදියේ සන්ධියට සහ ලැස්කැරින් වීදියේ සන්ධිය දක්වාත්ය ; නැගෙනහිරට : ලැස්කැරින් වීදියේ සිට බටහිර පැත්ත ස්කිනර් පාරේ (දකුණු) සන්ධියේ සිට පෙදෙස හා ජම්පටා වීදිය ; දකුණට : එහි සන්ධියේ සිට ජම්පටා වීදියේ උතුරු පෙදෙස, කෝටබෝම් වීදිය සහ ලැස්කැරින් වීදියේ සන්ධිය දක්වා පෙදෙස ; සහ බටහිරට : එකී සන්ධියේ සිට කෝටබෝම් වීදියේ නැගෙනහිර පෙදෙස, ජම්පටා වීදියේ සන්ධියේ සිට ස්කිනර් පාර (උතුරට) සන්ධිය දක්වා වූ පෙදෙසත්ය. | 10.00 ... | 7.00 ... | 7.00 ... | 5,000 ... | 70.6.27 |
| 2 ... | නො. 5 කොට්ඨාශය, කොටහේන බටහිර (ස්කිනර්ස් පාර) | එම සන්ධියේ සිට උතුරු ස්කිනර් පාරේ උතුරු පෙදෙස, පිකරින් පාරේ සහ කොටහේන වීදියේ සන්ධිය දක්වා වූ පෙදෙස | 11.00 ... | 7.00 ... | 7.00 ... | 5,000 ... | එම |
| 3 ... | නො. 2 කොට්ඨාශය, මෝදර | (ඒ) ඉහළ වීදියේ ප්‍රදේශය, ඇන්ඩෲ පෙදෙසේ සන්ධිය දක්වා, අලුත් මාවක පාර සහ සාන්ත ඇන්ඩෲ පාරේ සන්ධිය දක්වා, (බී) සාන්ත ඇන්ඩෲ පාර පෙදෙසේ සන්ධිය දක්වා, ඉහළ සාන්ත ඇන්ඩෲ පෙදෙසේ සහ මාෂල් වීදියේ සන්ධිය දක්වා, (සී) මෝදර වීදියේ ප්‍රදේශ සහ එහි සන්ධිය දක්වා, මාෂල් වීදියේ සහ මාදම්පිටිය පාරේ සන්ධිය දක්වා, (ඩී) සාන්ත ජේම්ස් වීදියේ දෙපස එහි සන්ධිය දක්වා, මෝදර වීදියේ සහ අලුත් මාවක පාරේ සන්ධිය දක්වා, (ඊ) අලුත්මාවත පාරේ දෙපස සහ එහි සන්ධිය දක්වා, එලී පටුමග සහ පහළ සාන්ත ඇන්ඩෲ පෙදෙසේ සන්ධිය දක්වාත්ය. | දවල් 12.00 ... | 7.00 ... | 7.00 ... | 5,000 ... | එම |
| 4 ... | නො. 3 කොට්ඨාශය, මාදම්පිටිය (පර්ගියුෂන් පාර) | ප්‍රදේශය මෙසේ සීමා වී තිබේ:—උතුරට: පර්ගියුෂන් පාර දකුණු පෙදෙසේ සිට සන්ධිය දක්වා සහ මට්ටක්කුලිය පල්ලිය පාරේ ගහ දක්වා ; නැගෙනහිරට : ලූකස් පාරේ බටහිර පෙදෙසේ සිට සන්ධිය දක්වා, පර්ගියුෂන් පාරේ සහ මාදම්පිටිය පාරේ සන්ධිය දක්වා ; දකුණට : මාදම් පිටිය පාරේ උතුරු පෙදෙසේ සිට සන්ධිය දක්වා, ලූකස් පාරේ සහ දනියෙල් පාරේ සන්ධිය දක්වා ; බටහිරට : දනියෙල් පාරේ නැගෙනහිර පෙදෙසේ සිට සන්ධිය දක්වා, මාදම්පිටිය පාරේ සහ හීනමුල්ල පටු මගේ සන්ධිය දක්වාත්ය. | 2.00 ... | 7.00 ... | 7.00 ... | 5,000 ... | එම |
| 5 ... | නො. 3 කොට්ඨාශය, මාදම්පිටිය | ප්‍රදේශය මෙසේ සීමා වී තිබේ :—උතුරට : පර්ගියුෂන් පාරේ දකුණු පෙදෙසේ සිට සන්ධිය දක්වා ලූකස් පාරේ සහ නාගලගම් වීදියේ සන්ධිය දක්වා ; නැගෙනහිරට : නාගලගම් වීදියේ දකුණු පෙදෙසේ සිට සන්ධිය දක්වා, පර්ගියුෂන් පාරේ සහ මාදම්පිටිය පාරේ සන්ධිය දක්වා ; දකුණට: මාදම්පිටිය පාරේ උතුරු පෙදෙසේ සිට සන්ධිය දක්වා, නාගලගම් වීදිය සහ ලූකස් පාරේ සන්ධිය දක්වා : බටහිරට : ලූකස් පාරේ නැගෙනහිර පෙදෙසේ සිට සන්ධිය දක්වා, මාදම්පිටිය පාරේ සහ පර්ගියුෂන් පාරේ සන්ධිය දක්වාය. | 3.00 ... | 7.00 ... | 7.00 ... | 5,000 ... | එම |

කොළඹ දිස්ත්‍රික්කය (කොළඹ නාගරික පෙදෙසින් පිට)

| (ඒ) අනුක්‍රමික අංකය | (බී) ප්‍රදේශය | (සී) ප්‍රාදේශික ප්‍රදේශය (කැබැරුමට අයත් විය යුතු පෙදෙස) | (ඩී) ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාව පෙරවරු | (ඊ) කැබැරුම් විවෘත කරන වේලාව පෙරවරු | (ඇෆ්) කැබැරුම් වසන වේලාව පස්වරු | (ජී) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල රු. | (එච්) විකිණීම කරන දිනය |
|---|---|---|---|---|---|---|---|
| 6 | හැඳල සුළු නගර සභාව, කොට්ඨාශ අංක 4 | හැඳල සු.න. අංක 4 කොට්ඨාශයේ තිඹිරිගස් යාය ගමේ පමණක් | 10.00 | 8.00 | 8.00 | 3,000 | 70.6.28 |
| 7 | දකුණු අළුත්කූරු කෝරළේ | උස්වැටකෙයියාව ගමේ පමණක් | 10.30 | 7.00 | 7.00 | 3,000 | එම |
| 8 | කඳාන සුළු නගර සභාව කොට්ඨාශ අංක 2 | කඳාන සු. න. අංක 2 කොට්ඨාශයේ කඳාන ගමේ පමණක් | 11.00 | 7.00 | 7.00 | 5,000 | එම |
| 9 | ජාඇල නගර සභාව, කොට්ඨාශ අංක 6 | ජාඇල නගර සභාව කොට්ඨාශ අංක 6 හෙට්ටිගම-වැලිගම්පිටිය ගමේ පමණක් | 11.30 | 7.30 | 7.30 | 3,000 | එම |
| 10 | ජාඇල නගර සභාව, කොට්ඨාශය අංක 1 | ජාඇල නගර සභාව, කොට්ඨාශ අංක 1 කණුවන ගමේ පමණක් | දවල් 12.00 | 7.30 | 7.30 | 3,000 | එම |
| 11 | දකුණු අළුත්කූරු කෝරළේ | ඒකල-මෙගොඩ බෝලන්ද ගමේ පමණක් | පස්වරු 2.00 | 7.00 | 7.00 | 3,000 | එම |
| 12 | එම | බෝපිටිය ගමේ පමණක් | 2.30 | 7.00 | 7.00 | 1,500 | එම |
| 13 | එම | මහවත්ත ගමේ පමණක් | 3.00 | 7.00 | 7.00 | 1,500 | එම |
| 14 | එම | දඩුගම ගමේ පමණක් | 3.30 | 7.00 | 7.00 | 1,500 | එම |
| 15 | උතුරු අළුත්කූරු කෝරළේ | සිත්තප්පාඩුව ගමේ පමණක් | 4.00 | 7.00 | 7.00 | 2,500 | එම |
| 16 | (ඒ) එම | බසියාවත්ත ගමේ පමණක් | පෙරවරු 10.00 | 7.00 | 7.00 | 1,500 | 70.6.29 |
| 17 | එම | පිට්පන ගමේ පමණක් | 10.30 | 7.00 | 7.00 | 3,000 | එම |
| 18 | එම | මූකලන්ගමුව ගමේ පමණක් | 11.00 | 7.00 | 7.00 | 4,000 | එම |
| 19 | එම | කටුනායක ගමේ පමණක් | 11.30 | 7.00 | 7.00 | 4,000 | එම |
| 20 | මීගමුව මහ නගර සභාව, කොට්ඨාශ අංක 11 | මීගමුව මහ නගර සභාව, කොට්ඨාශ අංක 11 කුරණ ගමේ පමණක් | දවල් 12.00 | 9.00 | 9.00 | 4,000 | එම |
| 21 | මීගමුව මහ නගර සභාව, කොට්ඨාශ අංක 10 | මීගමුව මහ නගර සභාව කොට්ඨාශ අංක 10 මහ වීදියේ බෝලවලාන ගමේ පමණක් | පස්වරු 2.00 | 9.00 | 9.00 | 5,000 | එම |
| 22 | මීගමුව මහ නගර සභාව, කොට්ඨාශ අංක 3 | මීගමුව මහ නගර සභාව කොට්ඨාශ අංක 3 කාමච්චෝඩි ගමේ පමණක් | 2.30 | 9.00 | 9.00 | 5,000 | එම |
| 23 | මීගමුව මහ නගර සභාව, කොට්ඨාශ අංක 9 | මීගමුව මහ නගර සභාව කොට්ඨාශ අංක 9 උඩයාර්තෝප්පු ගමේ පමණක් | 3.00 | 9.00 | 9.00 | 3,000 | එම |
| 24 | මීගමුව මහ නගර සභාව, කොට්ඨාශ අංක 5 | මීගමුව මහ නගර සභාව කොට්ඨාශ අංක 5 කුඩාපාඩුව ගමේ පමණක් | 3.30 | 9.00 | 9.00 | 3,000 | එම |
| 25 | උතුරු අළුත්කූරු කෝරළේ (ඒ) | දළුපොත ගමේ පමණක් | 4.00 | 7.00 | 7.00 | 3,000 | එම |
| 26 | උතුරු අළුත්කූරු කෝරළේ (ඒ) | පෝරුතොට ගමේ පමණක් | පෙරවරු 10.00 | 7.00 | 7.00 | 2,500 | 70.7. 1 |
| 27 | කොච්චිකඩේ සුළු නගර සභාව, කොට්ඨාශ අංක 1 | කොච්චිකඩේ සු.න. සභාව අංක 1 කොට්ඨාශයේ සීමාව තුළ පමණක් | 10.30 | 7.00 | 7.00 | 4,000 | එම |
| 28 | උතුරු අළුත්කූරු කෝරළේ (ඒ) | නැගෙනහිර පළහතුරේ ගමේ පමණක් | 11.00 | 7.00 | 7.00 | 3,000 | එම |
| 29 | එම | ඇත්ගාල ගමේ පමණක් | 11.30 | 7.00 | 7.00 | 2,500 | එම |
| 30 | එම | නැගෙනහිර කටාන ගමේ පමණක් | දවල් 12.00 | 7.00 | 7.00 | 3,000 | එම |
| 31 | එම | බම්බුකුලිය ගමේ පමණක් | පස්වරු 2.00 | 7.00 | 7.00 | 1,500 | එම |
| 32 | එම (බී) | දෙමන්හන්දියේ ගමේ පමණක් | 2.30 | 7.00 | 7.00 | 3,000 | එම |
| 33 | එම (බී) | දගොන්න ගමේ පමණක් | 3.00 | 7.00 | 7.00 | 3,000 | එම |

ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

**(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)**

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. පෝය දිනවලට පෙර දින පෙරවරු 9 සිට පස්වරු 1 දක්වා ද, වෙනත් දිනවල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුයි.

4. පෝය දිනවලට පෙරදින දවල් 12 ට සහ වෙනත් දිනවල පස්වරු 3.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත " පිටපත " කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ රෙජිස්ට්‍රාර් මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි:—

| | | | | රු. | ශ. |
|---|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | ... | ... | ... | 20 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | | ... | ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | | ... | ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | | ... | ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළු දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 68.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | | | | මෙරට | | පිටරට |
|---|---|---|---|---|---|---|
| | | | | රු. ශ. | | රු. ශ. |
| එක් කොටසක් | ... | ... | ... | 46 0 | ... | 60 0 |
| I වැනි කොටසේ එක ඡෙදයක් | | ... | ... | 36 0 | ... | 42 0 |
| I වැනි කොටසේ ඡෙද දෙකක් | | ... | ... | 43 50 | ... | 51 50 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | | | මිළ රු. ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. ශ. |
|---|---|---|---|---|---|
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුලත දී එක කොටසක් | ... | ... | 0 50 | ... | 0 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් | | | 1 00 | ... | 0 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡෙදයක් | ... | ... | 0 30 | ... | 0 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, I වැනි කොටසේ එක ඡෙදයක් | ... | ... | 0 60 | ... | 0 15 |

දායක මුදල් බාර ගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම යැවිය යුතුය.

## උපලේඛනය

**1970**

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| අප්‍රේල් | 70 4. 3 සිකුරාද | 70. 3.25 බදාදා | ප.ව. | 3.30 |
| | 70. 4.10 සිකුරාද | 70. 4. 3 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 4.17 සිකුරාද | 70. 4. 8 බදාදා | ප.ව. | 3.30 |
| | 70. 4.24 සිකුරාද | 70. 4.17 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 4.30 බ්‍රහස්පතින්ද | 70. 4.23 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| මැයි | 70. 5. 8 සිකුරාද | 70. 4.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 5.15 සිකුරාද | 70. 5. 8 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 5.22 සිකුරාද | 70. 5.15 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 5.29 සිකුරාද | 70. 5.22 සිකුරාද | ප.ව. | 3.30 |
| ජුනි | 70. 6. 5 සිකුරාද | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද | 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද | 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

1970 මාර්තු මස 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි.